සත්ව ලෝකයේ සත්තු කථා කරති. ඔවුන් අතර විවාහ මංගල්‍ය සිදු වන ආකාරය විචිත්‍රවත් ලෙස දැක්වීමට මෙම ලේඛකයා 'මඟුල් කෑම' නම් සිය ළමා සාහිත්‍ය කෘතියෙන් යොමු වී ඇත. මේ අනුව බලන විට, දරුවන්ගේ ලෝකය වූ කලී කල්පිතයක සැරිසරමින් සිට ක්‍රමක්‍රමයෙන් එයින් මෑත් වෙමින් යථාර්ථය කරා පියමං කරන වටපිටාවකින් සමන්විත වෙයි. මෙම මානසික යොමුව උපයෝගී කරගනිමින්ම, අප සතු චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳව දරුවන් තුළ අවධානයක් ඇති කරවීම අපහසු කටයුත්තක් නොවන්නේය.

එදා ශ්‍රී ලංකාව තුළ අලුත් අවුරුදු සැමරීමේ අවස්ථාවලදී වැඩිහිටියෝ තම දූ දරුවන් තමන් සමීපයෙහි තබාගෙන අලුත් අවුරුදු චාරිත්‍ර ඉටු කරන ආකාරය ඔවුන්ට දැක බලාගැනීමට අවස්ථාව පාදා දුන්හ. සුබ මොහොත උදා වෙත්ම, වටින් ගොඩින් ඇසෙන රතිඤ්ඤා හඬ සමග රබන් හඬ ද එක් වෙමින් සෑම නිවසකම ගෘහණියෝ නියමිත දිසාවට හැරී ලිප ගිනි මෙළවූහ. අතීතයේ සිට පැවත එන චාරිත්‍ර අනුව නියමිත නැකැත් වෙලාවට රට පුරාම එම ශුභ කටයුත්ත සිදු වූ ආකාරය දරුවෝ දෙමාපිය වැඩිහිටියන්ගෙන් අසා දැනගත්හ. මෙවන් සාමූහික ක්‍රියාවක අර්ථවත් බව පරිගණක තාක්ෂණයෙන් ඔප්පු කර පෙන්විය නොහැකි වුවද, සමාජ විද්‍යාත්මකව, මනෝවිද්‍යාත්මකව එහි ඇති වැදගත්කම එදා දරුවන් වී සිටි, අද වැඩිහිටියන් බවට පත් වී ඇති අය අවබෝධ කරගෙන ඇත.

කිසියම් රටක් තුළ ජාතික උත්සවයක් සමරමින්, එකම නැකතකට සියලු දෙනා, එකම වර්ණයක අලුත් වස්ත්‍රවලින් සැරසී, එකම දිශාවට හැරී, ලිප ගිනි මෙළවීම, කිරිබත් පිසීම, අනතු-රුව එකම වෙලාවට ආහාර අනුභවය යන මේ පැවතුම් රටාව ජන සමාජයක් තුළ සාමූහිකත්වය පිළිබිඹු කරන්නකි. සමාජ විද්‍යාත්මකව ඔවුන් අතර සමතාවක්, එකමුතුබවක් ඇති කරන්නා සේම, මනෝවිද්‍යාත්මකව ගෙන බලන විට සිය ජාතික අභිමානය, යහගුණ පැවැත්ම, සතුට, විනෝදය, මානසික විශ්‍රාමය ආදී වැදගත් සාධක මතු කර ලන, තව දුරටත් ඒවා තහවුරු කර ලන ක්‍රියාවන් බවට පත් වී ඇත. මෙවන් යහ පැවැත්ම හා සිරිත් විරිත් දෛනිකව සිදු කරන ඒවා නොව ජාතික උත්සවයක් සැමරීමේදී ඉටු කෙරෙන විශේෂ චාරිත්‍ර ලෙස දරුවන්ට හඳුන්වා දීමෙන් ඒවායේ ඇති විචිත්‍ර භාවය ද සමග දරුවා සිය මනස තුළ ඒවා රඳවා ගනු ඇත.

සංස්කෘතිය හෝ සම්ප්‍රදාය යනු අබමල් රේණුවක වත් වෙනසක් නොකොට, පෙට්ටගමක ලා යතුරු දමා හිස මත තබාගෙන යා යුතු පෞරාණික උරුමයක් නොවේ. සංස්කෘතිය කලින් කලට අවශ්‍ය පරිදි සං-ශෝධනය කළ හැකිය, විය හැකිය. ඒ කෙසේ වුවද ජන සමාජයකට එහි ඇති අර්ථවත් බව හා වැදගත් කම බාල පරපුරට කියා දීමේදී නීරස දෙයක් හෝ තිත්ත කසායක් හෝ බලයෙන් පොවන්නා සේ කළ යුතු නැත. අවුරුදු සිරිත්වල ඇති සුන්දරත්වය, වෙනස, විවිධත්වය සමග දරුවන්ගේ ලෝකයට ලැබෙන ආස්වාදය ද ඔවුන්ට දැනෙන සේ ඒවා රස කර කියාදීමට වැඩිහිටි අපි සමත් විය යුතුය.

> *අලුත් අවුරුද්ද යනු සියල්ල අලුත් වන අවස්ථාවකි. වසන්තයේ උදාව සමග මුළු පරිසරයම අලුත් වෙයි. කුඹුරු වපුරා, අස්වනු කපා පාගා ගෙට ගන්නා වී කොටා අලුත් සහල් මංගල්‍යය පවත්වන අවස්ථාව දරුවන්ගේ හැඟීම් හා සිතුවිලි ද අලුත් කරවමින් සතුට ගෙන දෙවන අවස්ථාවක් බවට පත් කරගත හැකිය.*

දරුවන්ගේ එදිනෙදා ජීවිතයේදී, විශේෂයෙන්ම වර්තමාන සමාජය තුළ, පවත්නා කාර්යබහුල බව මෙන්ම, ඒකාකාරී ස්වභාවය ද මඳකට හෝ වෙනස් කොට ඔවුන්ට මානසික විශ්‍රාමයක් ලබා දීම සඳහා අලුත් අවුරුදු සමය මෙන්ම එම කාල සීමාව තුළ ඉටු කෙරෙන සිරිත් විරිත්, ඔවුන්ට නිරත විය හැකි විවිධ අවුරුදු ක්‍රීඩා ආදිය යොදා ගැනීමට ඇති ඉඩකඩ බහුලය. සාමාන්‍යයෙන් සිංහල ජන ක්‍රීඩා අතුරෙන් ක්‍රමයෙන් අභාවයට යමින් පවතින පංච කෙළිය, ඔළිඳ කෙළිය, ඔංචිලි වාරම් කියමින් ඔංචිලි පැදීම, විවිධ රබන් පද ගයමින් රබන් ගැසීම මෙන්ම කජු ඇට යොදා ගනිමින් කෙරෙන කජු සෙල්ලම් ද අපේ දරුවන් එදිනෙදා නිරත වන ඒකාකාරී ක්‍රීඩා අතරට අලුත් බවක් හා වෙනසක් ඇති කළ හැකි අගනා ජන ක්‍රීඩා වෙයි. වර්තමානයේ ජනමාධ්‍ය මගින්, විශේෂයෙන්ම රූපවාහිනී මාධ්‍ය මගින්, සම්පූර්ණ නිරවද්‍යතාවකින් යුක්ත නොවූවත්, මෙම ක්‍රීඩා පිළිබඳ දරුවන්ට හැඟීමක්, දැනීමක් ලබා දෙන්නට දරන තැත අගය කළ යුතුය.

අලුත් අවුරුද්ද යනු සියල්ල අලුත් වන අවස්ථාවකි. වසන්තයේ උදාව සමග මුළු පරිසරයම අලුත් වෙයි. කුඹුරු වපුරා, අස්වනු කපා පාගා ගෙට ගන්නා වී කොටා අලුත් සහල් මංගල්‍යය පවත්වන අවස්ථාව දරුවන්ගේ හැඟීම් හා සිතුවිලි ද අලුත් කරවමින් සතුට ගෙන දෙවන අවස්ථාවක් බවට පත් කරගත හැකිය. නගරබදව ජීවත් වන දරුවන්ට පහසුවෙන් නොලැබුණත් ගැමි පරිසරයේ හෝ ගැමි පෙදෙස්වලට ආසන්නව හෝ ජීවත් වන දරුවන්ට ගහ කොළ, සතා සිවුපාවා වසන්තයේ උදාවට දක්වන ප්‍රතිචාර සමග ඔවුන්ගේ ද සිත්සතන් ප්‍රීති ප්‍රමෝදයට පත් කර ලීමට උපකාරී විය හැකිය. අලුත් අවුරුද්ද වෙනුවෙන් තම ගෙදර දොර පෙනුම අලුත් වන සැටි මෙන්ම වැඩිහිටියන් අවුරුදු කන්නට ලකලෑහැස්ති වන ආකාරය ද දරුවන්ගේ සිත් පහන් කරමින් බලාපොරොත්තු දල්වා ගැනීමට යොමු කරවිය හැකිය. අවුරුද්දට තමන්ට ලැබෙන අලුත් ඇඳුම් හා වෙනත් තෑගි බෝග ද ගැන සිහින මවන අපේ දරුවන්ට අවුරුද්ද ළං වෙත්ම එහි ප්‍රතිඵල අත් විඳින්නට ලැබීම ද වැදගත් දෙයකි.

අවුරුදු උදාවත් සමග වෙනදා නොමැති කලඑළියකින් තම නිවසත්, පවුලේ අයත්, අවට පරිසරයත් එළි පෙහෙළි වන ආකාරය දරුවන්ගේ සිත් සතන් සතුටින් පුරවා ලීමට මහෝපකාරී වනු ඇත. අවුරුද්ද වෙනුවෙන් පියාගෙන් හෝ මව්පිය දෙදෙනාගේම ගනු-දෙනු වෙනුවෙන් ලැබෙන මුදල ද ඔවුන්ට මහාර්ඝ වස්තු-වකි. හෝරා යන්ත්‍රය දෙසම බලාගෙන පවුලේ සියල්ලන් එකතු වී, අවට ඇසෙන රතිඤ්ඤා හඬින් එකම මොහොතට ලිප දල්වා පිසින කිරිබත් සහිත අවුරුදු කෑම මේසයට එක් වන දරුවන්ට සම්ප්‍රදාය මෙන්ම ඊට ඇතුළත් අප සතු අගනා සිරිත් විරිත් ද හුදෙක් යල් පැන ගිය දේ නොවනු ඇත. අවුරුද්දක් පාසා දෙමාපියන් හා එකතුව භුක්ති විඳින අවුරුදු කෑම බීමවල රසය අමතක නොවන්නා සේම මෙවැනි සුන්දර හා විචිත්‍ර වූ අවුරුදු සිරිත් අනාගත පරපුර වෙතට ද ගෙන යාමට අපේ දූ පුතුන් හුරු කරවීම අප සතු වගකීමක් බව නිරතුරුවම සිත්හි තබාගත යුතු වනු ඇත.


## සන්නස නව ගිණුම් අංකය

සන්නස පුවත්පතේ වෙළඳ දැන්වීම් සඳහා ගෙවීම්
පහත දැක්වෙන සන්නස නව ගිණුමට ගෙවන මෙන් ඉල්ලා සිටිමු

Account Name - Sannasa Media
Bank - Commonwealth Bank
BSB Number - 063619
Account Number - 10852409

Sannasa Media

**සන්නස මීඩියා Sannasa Media**



Celebrating

2003 10 Years 2013

AUSTRALIA GATEWAY
Australian Immigration Law Advisory

THE LEADING AUSTRALIAN MIGRATION LEGAL ADVISORY FIRM IN SRI LANKA

*"You have kept trust on us because we delivered results in simple Immigration matters to most complicated Immigration legal matters. In Australia we have won appeals and still winning. It is the spirit of our team. Our team of lawyers and consultants are either qualified in Australia or Sri Lanka and we are committed with absolute confidence, honesty to deliver results to you"*



**Susantha Katugampala** - LL B (Monash) Barrister & Solicitor in Australia
Chairman
Fairfields Lawyers Australia
Australia Gateway Sri Lanka

Accredited Immigration Law Specialist

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE
10 Morrison Place East Melbourne Victoria 3002 Australia
T : +61 3 9650 4557 F : +61 3 9650 4559 M : +61 417 851 041
info@fairfieldslawyers.com

AUSTRALIA GATEWAY
No. 602 Level 6 Jaic Hilton Towers, Colombo 2 Sri Lanka
T : +94 112 300627 M : +94 777 347670 M : +94 717 347670
admin@australiagateway.com

**We Deliver Results...**